# "ICHC- 2026"

## "නිවාස හා ඉදිකිරීම් සඳහා නව නිපැයුම් තරගය-2026

**කොන්දේසි සහ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ-**

මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය,පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වෙමින් පවත්වන **"නිවාස ඉදිකිරීම් සඳහා නව නිපැයුම් තරගය-2026"** සඳහා මධ්‍යම පළාත තුළ අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ **ජයග්‍රාහකයන්ට හිමිවන විශේෂ වරප්‍රසාද**

- ➢ ජයග්‍රහන සඳහා වටිනා සහතික පත්‍ර/පදක්කම්/තිළිණ ලබාදෙනු ලැබේ.
- ➢ තරගය සඳහා ඉදිරිපත් වන සිසුන්ගෙන් ඒ ඒ අංශ වලින් පළමු දෙවන හා තෙවන ස්ථාන ලබන ජයග්‍රාහක නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට හා වැඩිදියුණු කිරිමට අවශ්‍ය මග පෙන්වීම් ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිෂන් සභාව වෙතින් ලබාගැනිමේ අවස්ථාව හිමි වේ.
- ➢ තරගයට ඉදිරිපත් වන සෑම අයදුම්කරුවෙකුටම වටිනා සහතිකයක් හිමි වේ.
- ➢ ජයග්‍රාහකයින්ගේ පාසල් සඳහාද ඇගයීමක් හිමි වේ.

❖ **ඉදිරිපත් විය හැකි අංශ**

පහත අංශයකින් ඔබට තරග සඳහා ඉදිරිපත් විය හැකිය.

1.පාසල් අංශය
2. විවෘත අංශය

- **පාසල් අංශය -**

13 ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට අයදුම් කළ හැකිය. පාසල් නියෝජනය කරන සිසුන්ට පාසල් අංශය හැර වෙනත් අංශයකින් ඉදිරිපත් විය නොහැකිය. ඔවුන් අයදුම්පත් යොමු කරන අවස්ථාවේදී පාසල් හැරගිය ශිෂ්‍යයන් නොවිය යුතුය. මෙම අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත පාසලේ විදුහල්පතිගේ නිර්දේශය සහිතව යොමු කළ යුතුය.

- **විවෘත අංශය-**

වයස අවුරුදු 16-25 ත් අතර පාසල් හැර ගිය ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

❖ **ඉදිකිරීම් නව නිපැයුම් සඳහා වන පොදු උපදෙස්-**

මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව මගින් නිර්වචනය කර ඇති පරිදි අයදුම්කරුවන් අදාළ අංශයන්ගෙන් හැර වෙනත් අංශයකින් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර නිවැරදි තරග අංශයට ඉදිරිපත් නොවූ අයදුම්පත් නිවාස දෙපාතර්මේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඔබ විසින් ඉදිරිපත් කරන සෑම නව නිපැයුමකටම එක් අයදුම්පත බැගින් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. එක් අයදුම්පතක නව නිපැයුම් එකකට වැඩි ගණනක් පිළිබඳව සටහන් කිරිම ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

- **පාසල්/විවෘත යන අංශ දෙකෙහිම කණ්ඩායම් නව නිපැයුමක් නම් කණ්ඩායමේ උපරිම සාමාජිකයන් ගණන 03** කි. කණ්ඩායම් නව නිපැයුම් ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී අයදුම්පත්‍රයේ පළමුව නම සඳහන් කර ඇති සිසුවා කණ්ඩායමේ නායකත්වය ලබන පුද්ගලයා ලෙස සලකා බලනු ලබයි. කණ්ඩායමේ සාමාජිකයන් පිළිබඳව පසුව සිදු කරනු ලබන වෙනස්වීම් දෙපාර්තමේන්තු විසින් භාරගනු නොලැබේ.

- **තරගය සඳහා නව නිපැයුම ඉදිරිපත් කිරීමේ ක්‍රමවේද**

(A) අයදුම්පත්‍රය සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඔබට පහසු භාෂාවකින් සම්පූර්ණ කරන්න. අයදුම්පතේ අංක 12 යටතේ ඔබේ නව නිපැයුම සම්බන්ධව හා එය ක්‍රියාත්මක ආකෘතිය පිළිබඳ අවශ්‍ය චිත්‍ර සටහන් සමඟ සම්පූර්ණ විස්තරයක් ඔබට පහසු භාෂාවකින් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) අමුණන්න.සියළු චිත්‍ර/සටහන් නම් කරන්න.

(B) පළමු වටයේ ඔබගේ අයදුම්පත සමග ඉදිරිපත් කරන සම්පූර්ණ තොරතුරු පදනම් කරගෙන, සුදුසුකම්ලත් තරගකරුවන් අවසාන වටයට කැඳවනු ලැබේ. **එහිදී නව නිපැයුම භෞතිකව ඉදිරිපත් කළ යුතුය**. නව නිපැයුම තරග විනිශ්චය සඳහා භෞතිකව ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවන්හිදී පමණක් නව නිපැයුම හා එහි ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීම උදෙසා ඉදිරිපත් කළ හැකි තරමේ ප්‍රමාණවත් තොරතුරු විනිශ්චය මණ්ඩලය වෙත අයදුම්කරුවන් විසින් සැපයීමට වගබලා ගත යුතුය.

- **<u>මෙම මාර්ගෝපදේශයෙහි ඇතුළත් උපදෙස් පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් නිවාස දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ</u>**

I. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඔබගේ පාසල/වෘත්තීය පුහුණු ආයතනය මගින්, සාමාන්‍ය තැපැල/ලියාපදිංචි තැපැල ඔස්සේ හෝ කාර්යාලයට ගෙනවිත් භාරදීම **<u>2026.07.31</u>** දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුවේ පහත ලිපිනයට ලැබෙන සේ යොමු කළ යුතුය.

II. ඔබ කිසියම් විශ්ව විද්‍යාලයක/වෘත්තීය පුහුණු ආයතනයක පාඨමාලාවක් හදාරන්නෙකු නොවේනම් ඔබගේ අයදුම්පත සෘජුවම යොමු කළ යුතුය.

**<u>නිවාස හා ඉදිකිරීම් සඳහා නව නිපැයුම් තරගය -2026 යනුවෙන්</u>** ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර **<u>නිවාස කොමසාරිස්, මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව, අංක 109, යටිනුවර වීදය, මහනුවර</u>** යන ලිපිනය වෙත යොමු කළ යුතුය.

තවද සාමාන්‍ය තැපැල, ලියාපදිංචි තැපැල මගින් හෝ අතින් භාරදුන් අයදුම්පත සම්පූර්ණ කර දෙපාර්තමේන්තුව වෙත යොමු කළ පසු අයදුම්පත සඳහා කිසිදු වෙනස් කිරීමක් දෙපාර්තමේන්තුව විසින් භාරගනු නොලැබේ.එසේම,

- ඇගයීම් පැවැත්වෙන දිනයේ රැගෙන එන නව අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- ලියාපදිංචි වූ නව නිපැයුම්කරුවන් සඳහා ඔබගේ පාසල/ ආයතනය වෙත හෝ ඔබ වෙත දැනුම් දෙනු ලබන කාලසටහනෙහි දක්වා ඇති පරිදි නියමිත දිනයේ අදාල තෝරාගැනීම සඳහා නියමිත ස්ථානයට පමණක් සහභාගී විය යුතු වන අතර, දෙපාර්තමේන්තුව විසින් නැවත දැනුවත් කිරීමේ ලිපියක් යොමු නොකරන බව සැලකිය යුතුය. කිසියම් හේතුවකින් අදාල දිනයන්හි සංශෝධනයන් සිදුවන්නේ නම් පමණක් ඒ පිළිබඳව දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

- **<u>බුද්ධිමය දේපළ අයිතිය</u>**

  තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන නව නිපැයුම් <u>ස්ව නිර්මාණ</u> විය යුතුය. වෙනත් පුද්ගලයෙකු විසින් නිර්මාණය කරන ලද නව නිපැයුමක් ප්‍රතිනිර්මාණය කරන ලද නව නිපැයුමක් ලෙස තරගයට ඉදිරිපත් නොකළ යුතුය. යම් හෙයකින් එසේ ඉදිරිපත් කර ජයග්‍රහණය ලබා ඇති අවස්ථාවකදී එම නව නිපැයුම් මුල් හිමිකරුගේ බුද්ධිමය දේපළ අයිතිය උල්ලංඝනය වී ඇති බව නිසි සාක්ෂි සහිතව තහවුරු වුවහොත් ප්‍රදානය කරන ලද ත්‍යාග හා සියළුම සහතික ආපසු ලබාගැනීමට නිවාස දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර එසේ ආපසු ලබාදීම සඳහා ඔබ බැදී සිටී.

- **<u>තරගය පැවැත්වීම සහ තරග විනිශ්චය</u>**

  1.දෙපාර්තමේන්තුව මගින් අනුමත විනිශ්චය මණ්ඩලයේ තීරණය, විනිශ්චය සම්බන්ධයෙන් අවසන් තීරණය වේ.

  2.දැනුවත් කිරීමේ වැඩසටහන් හා නව නිපැයුම් තෝරාගැනිමෙ මූලික තරග පැවැත්වීමට නියමිත දිනයන් සහ ස්ථාන වෙනස් කිරීම ඇතුළු අනෙකුත් සියලු කරුණු පිළිබඳව තීරණ ගැනීමේ පූර්ණ අයිතිය දෙපාර්තමේන්තුව සතු වේ.

❖ **<u>තරගය සඳහා ඉදිරිපත් විය හැකි ඉදිකිරීම් ආශ්‍රිත ක්ෂේත්‍ර</u>**

ඔබගේ නව නිපැයුම පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් වඩාත් සුදුසු එක් ක්ෂේත්‍රයකට අයත් විය යුතුය.

i. ඉදිකිරීම් ද්‍රව්‍යය සඳහා ආදේශකයක්

ii.ඉදිකිරීම් තාක්ෂණය

iii.ඉදිකිරීම් ක්ෂේත්‍රය හා ආරක්ෂිත උපකරණ/උපාංග

iv.නව ඉදිකිරීම් වින්‍යාසය (ආදර්ශ ආකෘති)

වැඩිදුර තොරතුරු සඳහා 081-2222457 ඔස්සේ නිවාස දෙපාර්තමේන්තුව (ඉෂාරි/නිශාමනි ) අමතන්න.

වෙබ් අඩවිය www.housingdept.cp.gov.lk

# "ICHC- 2026"

## "නිවාස හා ඉදිකිරීම් සඳහා නව නිපැයුම් තරගය-2026"

### තරග අයදුම්පත

**සියලුම දත්ත සම්පූර්ණ කරන්න. නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. පූර්ව දැනුවත් කිරීම් මාර්ගෝපදේශයන් හා කොන්දේසි කියවීමෙන් අනතුරුව අයදුම්පත්‍රය පුරවන්න.**

**අදාළ කොටුව ඉදිරියේ (X) ලකුණ යොදන්න.**

<u>ඔබ තරගය සඳහා ඉදිරිපත් වන අංශය</u>

පාසල් අංශය ☐
විවෘත අංශය ☐

- ඔබගේ නව නිපැයුමේ වර්තමාන තත්වය 1.සංකල්පයකි ☐ 2.ක්‍රියාකාරි ආකෘතියකි ☐ 3.නිෂ්පාදනයකි ☐
- ඔබගේ නිර්මාණ ඉදිපත් කරනු ලබන ක්ෂේත්‍රය

A ඉදිකිරීම් ද්‍රව්‍යය සඳහා ආදේශකයකි ☐
B ඉදිකිරීම් තාක්ෂණය ☐
C ඉදිකිරීම් ක්ෂේත්‍රය හා ආරක්ෂිත උපකරණ/උපාංගයකි ☐
D නව ඉදිකිරීම් විනාසය (ආදර්ශ ආකෘති) ☐

- ඔබ ඉදිරිපත් කරන නව නිපැයුම
- කණ්ඩායම් නිපැයුමක්ද ඔව් ☐ නැත ☐
  පිළිතුර ඔව් නම් ඔබගේ කණ්ඩායමේ සාමාජිකයන් ගණන............(උපරිම 03)
  ඔබගේ නව නිපැයුම් කණ්ඩායම් නව නිපැයුමක් නම් පහත 1-8 දක්වා තොරතුරු එක් එක් කණ්ඩායම් සාමාජිකයන්ට ආදාලව වෙන වෙනම පුරවා අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

1.ඔබගේ සම්පූර්ණ නම(සිංහලෙන්): ..........................................................................................
..........................................................................................

2.සහතික පත්‍රය සඳහා ඔබගේ මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්):.......................................................
..........................................................................................

3.වයස:................................ 4.දිස්ත්‍රික්කය:..................................................

5.තොරතුරු දැනුම් දිය යුතු ලිපිනය: ..........................................................................................
..........................................................................................

6.ඔබව සම්බන්ධ කරගතහැකි දුරකථන අංකය:

ජංගම ...................................... වට්ස්ඇප් අංකය:........................................

7.විද්‍යුත් තැපැල :..........................................................................................

8.අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න.

**(a)** ඔබ දැනට පාසල් අධ්‍යාපනයේ නිරත වෙමින් සිටීද? ඔව් ☐ නැත ☐

එසේනම් පාසලේ
නම:..........................................................................................
ලිපිනය:..........................................................................................
දුරකථන අංකය:................................ඊමේල් ලිපිනය:..........................................................
සම්බන්ධීකරණ ගුරුභවතාගේ නම:..................................... (වට්ස්ඇප් අංකය.).............................

විදුහල්පතිතුමා/විදුහල්පතිතුමියගේ නිර්දේශය-
ඉහත නම සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යයාව මෙම විදුහලේ ....................ශ්‍රේණියේ ඉගෙනුම ලබයි.
විදුහල්පතිගේ නම .............................................................
අත්සන..........................................................(මුද්‍රාව)

**(b) විවෘත අංශය සඳහා පමණි.**

ඔබ දැනට විශ්ව විද්‍යාලයක/ වෘත්තීය පුහුණු ආයතනයක පාඨමාලා හදාරන අයෙක්ද? ඔව් ☐ නැත ☐

නම:...........................................................................................................................

ලිපිනය:......................................................................................................................

දුරකථන අංකය (වට්ස්ඇප් අංකය.)..........................:.........ඊ මේල් ලිපිනය:........................

සම්බන්ධීකරණ ගුරුභවතාගේ නම:.................................... (වට්ස්ඇප් අංකය.)............................

**(c) විවෘත අංශය සඳහා පමණි -**

ඉහත නම සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යයාව මෙම ආයතනයේ ඉගෙනුම ලබන බව සහතික කරමි.

නම ..............................................................

අත්සන...........................................................(නිල මුද්‍රාව)

- **ඔබ කිසියම් ආයතනයක පාඨමාලා හදාරන්නෙකු නොවේනම් ඉහත (b)** කොටස පමණක් පුරවන්න.

9. නව නිපැයුමේ නම සිංහලෙන්:.........................................................................................................

10. නව නිපැයුමේ නම ඉංග්‍රීසියෙන් (අනිවාර්ය වේ) :........................................................................

11. ඔබගේ නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රය අයදුම් කර හෝ ලබාගෙන තිබේද? ☐ ඔව් ☐ නැත
ඔබගේ පිළිතුර ඔව් නම්,එම පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කරන ලද අංකය:.........................................

12. ඔබ ඉදිරිපත් කරන නව නිපැයුම, කණ්ඩායම් නව නිපැයුමක් නම්, ඔබගේ නම ඇතුළුව කණ්ඩායමේ සාමාජිකයන්ගේ මුලකුරු සමග නම් සහතිකපත්‍රය සඳහා ඉංග්‍රීසියෙන් අනිවාර්යයෙන් මෙහි සඳහන් කරන්න. (කණ්ඩායම් නව නිපැයුම් සඳහා සහභාගී විය හැකි උපරිම සිසුන් ගණන 03 කි.) පහත ඉඩ ප්‍රමාණවත් නොවේනම් වෙනම කොළයක අමුණන්න.)

1. ..............................................................................................................(ඔබගේ නම)
2. .............................................................................................................(සාමාජිකයන්ගේ නම්)
3. ..............................................................................................................

13.නව නිපැයුමේ ක්‍රියාකාරිත්වය(කෙටියෙන් සටහන් කරන්න)

(ඔබේ නව නිපැයුම සම්බන්ධව හා එය ක්‍රියාත්මක අකෘතිය පිළිබඳව අවශ්‍ය චිත්‍ර සටහන් සමග සම්පූර්ණ විස්තරයක් ඔබට පහසු භාෂාවකින් මෙම අයදුම්පතට (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) අමුණන්න. සියළු චිත්‍ර/සටහන් නම් කරන්න.)

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

14. මා විසින් සඳහන් කළ තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවත් මා විසින් විස්තර කර ඇති නව නිපැයුමේ අයිතිය මා සතු හෝ අංක 12 හි සඳහන් කණ්ඩායම සතු බවත් පහත අත්සන යොදා සහතික කරමි. තවද තෝරා ගැනීම් වලට අදාළව මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන කොන්දේසි හා නීති රීති වලට මම එකඟ වන බව ද සහතික කරමි. තවද නිවාස දෙපාර්තමේන්තුවේ නීති රීති වලට පටහැනි වන පරිදි අයදුම් කර ඇති අවස්ථාවක දී මගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව සතු බවත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වන බවත් හොඳින්ම දැන පහත අත්සන සහතික කරමි.

| | |
|---|---|
| .......................................... | ........................................ |
| දිනය | අත්සන |